# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2047/6 - 2017 නොවැම්බර් මස 27 වැනි සඳුදා - 2017.11.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### සබරගමුව පළාතේ පළාත් සභාව

2017 වසරේ අංක 14 දරන සබරගමුව පළාත් සභාවේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය.

2017.09.26 දින සබරගමුව පළාතේ පළාත් සභාවේ ගරු සභාපතිතුමා විසින් සහතිකය සටහන් කරන ලදී.

2017.11.02 දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥව දෙන ලදී.

සබරගමුව පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව**

***සබරගමුව පළාත් සභාවේ 2017 අංක 14 දරන කර්මාන්ත සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය***

2017. 09.26 වන දින සභා සම්මත කරන ලදුව 2017. 11. 02 වන දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලද සබරගමුව පළාත් සභවේ 2017 අංක 14 දරන කර්මාන්ත සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය නම් වූ මෙම ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

පී.එස්. ආර්. එම්. විජයරාජ,<br>
සභා ලේකම්,<br>
සබරගමුව පළාත් සභාව.

2017 නොවැම්බර් මස 22 වැනි දින,<br>
සබරගමුව පළාත් සභාවේ දීය.

1A - PG 3783— 12 (2017/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## සබරගමුව පළාතේ පළාත් සභාව

### 2017 අංක 14 දරන සබරගමුව පළාත් සභාවේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය

1990 අංක 04 දරන සබරගමුව පළාත් සභාවේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය ප්‍රඥප්ති අහෝසි හා අවලංගු වන බව

මෙම ප්‍රඥප්තිය පැනවීම මගින් මීට පෙර මෙම පළාත් සභාව විසින් පනවා තිබූ 1990 අංක 04 දරන සබරගමුව පළාත් සභාවේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය මෙයින් අවලංගු හා අහෝසි වේ.

**2017 අංක 14 දරන සබරගමුව පළාත් සභාවේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය**

***සබරගමුව පළාත තුළ කාර්මික, වාණිජ, වෙළඳ ව්‍යාපාර සහ ආදායම් උපදවන්නා වූ ව්‍යාපෘති පිහිටුවීම, සංවර්ධන හා ප්‍රවර්ධනය කිරීම පිණිස කර්මාන්ත සංවර්ධන අධිකාරියක් පිහිටුවීම සහ ඊට අදළ හෝ ආනුෂංගික කරුණු සඳහා සකස් කරන ලද ප්‍රඥප්තිය***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

01. මෙම ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 2017 අංක 14 දරන කර්මාන්ත සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණ දින සිට ක්‍රියාත්මක වන්නේය.

කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවීම

02. (i) සබරගමුව පළාත තුළ '' කර්මාන්ත සංවර්ධන අධිකාරිය'' යන නමින් හැඳින්වෙන අධිකාරියක් මෙයින් පිහිටුවනු ලැබේ. (මින් ඉදිරියට මෙම ප්‍රඥප්තියේ '' අධිකාරිය'' යයි හඳුන්වනු ලබන)

(ii) මෙම අධිකාරිය පළමු වන (01) උප ඡේදයේ හැඳින්වෙන නමින් අවිච්ජින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ සංස්ථා නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි සහ පවරනු ලැබීමද කළ හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

03. (i) සබරගමුව පළාත් සභාවේ කර්මාන්ත, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් අට දෙනෙකුගෙන් (08) අධිකාරිය සමන්විත විය යුතු අතර පහත සඳහන් ආකාරයට පත් කළ යුතු වන්නේ ය.

(අ) අමාත්‍යවරයා විසින් අධිකාරියේ විෂය හා අරමුණු සම්බන්ධව විශේෂ හැකියාවක් හා සුදුසුකම් ඇතැයි අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් දෙදෙනෙකු

(ආ) සබරගමුව පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයකු

(ඇ) සබරගමුව පළාතේ කර්මාන්ත සංවර්ධන පළාත් අධ්‍යක්ෂ

(ඈ) කර්මාන්ත අමාත්‍යංශයේ ගණකාධිකාරී

(ඉ) ජාතික ශිල්ප සභාවේ රත්නපුර හෝ කෑගල්ල දිස්ත්‍රික්කයේ සහකාර අධ්‍යක්ෂ හෝ සංවර්ධන සහකාර

(ඊ) සබරගමුව පළාතේ ඉංජිනේරු සේවා ඒකකයේ ඉංජිනේරුවරයෙකු

(උ) සබරගමුව පළාතේ කර්මාන්ත අමාත්‍යංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු

(ii) සබරගමුව පළාතේ කර්මාන්ත, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් අතුරෙන් එක් සාමාජිකයෙකු අධිකාරියේ සභාපතිවරයා වශයෙන් පත් කළ යුතුය. අධිකාරියේ සභාපති

(iii) කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව නිලබලයෙන් පත්වේ.

(iv) අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයාට අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකුට හිමිවන සියළු දීමනා හා වරප්‍රසාද හිමි වේ.

04. යම් තැනැත්තෙක්
(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් පත්වීමෙන් සාමාජිකත්වයට නුසුදුසුකම්

(ආ) අධිකාරියේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමේදී අගතිගාමීව බලපෑ හැකි මුල්‍යමය හෝ වෙනත් බැඳීමක් වේ නම් එම පුද්ගලයා අධිකාරියේ සාමාජිකයෙකු ලෙස පත්කරනු ලැබීමට හෝ තවදුරටත් කටයුතු කිරීමට සුදුස්සෙකු නොවිය යුතුය.

05. (i) පත් කරන ලද කිසිම සාමාජිකයෙකු මරණය, ඉල්ලා අස්වීම, ඉවත් කිරීම හෝ සබරගමුව පළාත් සභාවෙන් පිටතට මාරු කරනු ලැබීම හේතුවෙන් පුරප්පාඩු වුවහොත් හැර සේවා කාලය වර්ෂ තුනක් ( 03) වන අතර නැවත පත් කිරීමටද සුදුසුකම් ලබනු ඇත. අධිකාරියේ සාමාජිකයින්ගේ සේවා කාලය

(ii) කිසියම් සාමාජිකයෙකු ගේ මරණය, ඉල්ලා අස්වීමෙන් හෝ ඔහු සේවයෙන් ඉවත් කල අවස්ථාවකදී, අමාත්‍යවරයා විසින් තුන්වැනි (03) ඡේදයට අදාළව, ඉවත්ව ගිය පුද්ගලයා පත් කළ ආකාරයට වෙනත් තැනැත්තෙකු පත් කිරීමට බලය ලැබෙන්නේය. එකී සාමාජිකයා වෙනුවට පත් කළ කිසියම් පුද්ගලයෙක්, එම සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධුරය දැරීමට ඔහුගේ අනුප්‍රාප්තිකයා වශයෙන් අවස්ථාව ලැබේ. එහෙත් නව කර්මාන්ත අමාත්‍යවරයෙකු පත් වු අවස්ථාවකදී සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසිරුවා නව සභාපතිවරයෙකු හා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කළ යුතුය.

(iii) රොගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් කිසිවක් නිසා හෝ අධිකාරියේ කිසියම් සාමාජිකයෙක්ට තාවකාලිකව ඔහුගේ ධුරයේ කාර්යයන් ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් එකී තාවකාලිකව බැහැර සිටින කාල සීමාවට ඔහුගේ ස්ථානය වෙනුවට වෙනත් තැනැත්තෙකු පත් කළහැකි අතර එම කාර්යය තුන්වන ඡේදයේ විධිවිධානවලට අනුකුලව එම තාවකාලිකව බැහැරව සිටින සාමාජිකයා මුලින් පත් කළ ආකාරයට කළ යුතුවේ.

06. (i) අධිකාරියේ මුද්‍රාව අධිකාරියේ සාමාන්‍යාධිකාරී භාරයේ පැවතිය යුතුවේ. අධිකාරියේ මුද්‍රාව
(ii) අධිකාරියේ මුද්‍රා අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම් ආකාරයට වෙනස් කරනු ලැබිය හැකිය.

07. (i) අමාත්‍යවරයාට එසේ කිරීම අවස්ථාවෝචිත යැයි හැඟී යන අවස්ථාවක තුන්වැනි ඡේදය අනුව පත් කළ අධිකාරියේ ඕනෑම සාමාජිකයෙකු කිසිම හේතුවක් නොදන්වා ඉවත් කළ හැකිය. අධිකාරියේ සාමාජිකයින් ඉවත් කිරීම

(ii) පළමුවැනි (01) උප ඡේදයේ සඳහන් ආකාරයට සාමාජිකයෙකු ඉවත් කළ අවස්ථාවකදී එම තීරණය කිසිම අධිකරණයකින් ප්‍රශ්න කිරීම නොකළ යුතුය.

08. (i) ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන්, අධිකාරියේ සභාපති ඇතුළු ඕනෑම සාමාජිකයෙකුට ඕනෑම අවස්ථාවකදී ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය. අධිකාරියේ සාමාජිකයින් ඉල්ලා අස්වීම

09. අමාත්‍යවරයා විසින් තීරණය කළ හැකි වන යම් වේතන හෝ දීමනා අධිකාරියේ සභාපති, සාමාන්‍යාධිකාරී හා සාමාජිකයන්ට අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතුය. සභාපති හා අධිකාරියේ සාමාජිකයින්ගේ වේතන හා දීමනා

10. (i) අධිකාරියේ සභාපතිවරයා තමන් පැමිණ සිටින සෑම රැස්වීමකදීම මුලසුන දැරිය යුතුය. කිසියම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවකදී අධිකාරියේ පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරාගනු ලබන ඕනෑම සාමාජිකයෙකුට රැස්වීමේ මුලසුන දැරිය හැකිය. අධිකාරියේ රැස්වීම හා ගණපූරණය

(ii) අධිකාරියේ ඕනෑම රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හතර දෙනෙකු (04) විය යුතුය.

(iii) අධිකාරියේ ඕනෑම රැස්වීමකදී සියලු ප්‍රශ්න සඳහා ගනු ලබන තීරණ, පැමිණි සාමාජිකයන්ගෙන් බහුතර සංඛ්‍යාවේ කැමැත්ත අනුව තීරණය විය යුතුයි. එනමුත් සාමාජිකයන් බෙදී ඇත්තේ සමසේ නම්, සභාපති තැනට තීරක ඡන්දයක් ලැබිය යුතුවේ.

අධිකාරියේ කිසියම් ක්‍රියාවක් පත්වීමෙහි පුරප්පාඩු පැවතීම නිසා හෝ පත්වී මෙහි ඌණතාවය නිසා අවලංගු නොකිරීම.

11. අධිකාරියේ කිසියම් ක්‍රියාවක්, තීරණයක් හෝ නීති කෘත්‍යයක් හුදෙක් එම අධිකාරයේ සාමාජිකයන්ගේ පුරප්පාඩුවක් පැවතීම හෝ එම අධිකාරියේ සාමාජිකයෙක්ගෙන් කිසිවක් පත්වීමෙහි ඌණතාවයක් පැවතීම නිසා හෝ අවලංගු නොවිය යුතුයි.

අධිකාරියේ සාමාන්‍යාධිකාරී

12. අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ප්‍රවීණ හා පළපුරුදු තැනැත්තෙකු අධිකාරියේ සාමාන්‍යාධිකාරී වශයෙන් පත් කළ යුතුවේ.

අධිකාරියේ කාර්ය මණ්ඩලය පිළිබඳ බලය

13. අධිකාරියට

(අ) අධිකාරියේ කාර්ය මණ්ඩලය පිළිබඳව පත්වීම, පහකිරීම් සහ විනය පාලනය කිරීම් කළ හැකිවේ.

(ආ) කාර්ය මණ්ඩලයේ පඩිනඩි, වැටුප් හෝ වෙනත් දීමනා ගෙවීම් යනාදිය අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

(ඇ) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ද්විතීයනය පදනම මත පැමිණෙන සේවකයන්ට හැර අධිකාරිය යටතේ සේවය කරන අනෙකුත් කාර්ය මණ්ඩලයට ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ නොවේ.

(ඈ) කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථසාධක මුදලක් සහ වෙනත් වැඩ පිළිවෙලවල් පිහිටුවා පවත්වාගෙන යාමට හැකි අතර ඒවා සඳහා දායක මුදල් ගෙවිය හැකිද වේ.

(ඉ) කාර්ය මණ්ඩලයේ සේවය පිළිබඳව නියම හා කොන්දේසි නිශ්චය කළ හැකිවේ.

(ඊ) සේවකයින්ගේ හා නිලධාරීන්ගේ සුභ සාධන කටයුතු, රක්ෂණ කටයුතු හා හදිසි ආපදා සම්බන්ධයෙන් කටයුතු කළ හැකිවේ.

(උ ) අධිකාරියේ ආයතනවලට නිලධාරීන් හා සේවකයින් පත් කිරීමේදී අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට එම බලතල හිමිවේ. එම පත්වීම් ලිපි අත්සන් කිරීමේ බලය අමාත්‍යංශ ලේකම්ට හා සාමාන්‍යාධිකාරිට හිමිවේ. අවශ්‍ය අවස්ථාවල රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා තනතුරුවලට පත්කිරීමේ බලය හිමි වන්නේ අමාත්‍යංශ ලේකම් වෙතය.

(ඌ) අධිකාරියේ කාර්ය මණ්ඩලය තෝරා ගැනීමේදී සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට බලය හිමිවේ. ඔවුන් සම්බන්ධයෙන් විනය බලතල අමාත්‍යංශ ලේකම්වරයාට අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ ඇතිව කටයුතු කිරීමට බලය පැවරේ.

අධිකාරියේ බලතල සහ කාර්යයන්

14. අධිකාරියේ බලතල හා කාර්යයන් වනුයේ

(අ) පළාත් සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි කර්මාන්ත සංවර්ධනයට අදාල ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(ආ) සබරගමුව පළාතේ කර්මාන්ත, වාණිජ හා ව්‍යාපාර කටයුතු සහ වෙනත් ව්‍යාපෘති ආරම්භ කිරීම, දිරිගැන්වීම, නඟා සිටුවීම හා සංවර්ධනයට උපකාරී වීම.

(ඇ) අමුද්‍රව්‍ය හා දේශීය තාක්ෂණය සැපයීම හා බෙදාහැරීම.

(ඈ) කර්මාන්ත සංවර්ධනයට අදාළ තොරතුරු හා දැනුම ලබා ගැනීම හා සැපයීම.

(ඉ) අධිකාරිය සේවක සුභසාධනය සඳහා යෝජනා ක්‍රම ඇරඹීම.

(ඊ) විරැකියාවෙන් පෙළෙන්නන් සඳහා විවිධ ආයතනවලින් ලැබෙන අරමුදල් යටතේ පුහුණු වැඩසටහන් පැවැත්වීම, කාර්මිකයන් සඳහා අවශ්‍ය වන්නාවූ කළමනාකාරිත්වය හා ශිල්පීය දක්ෂතා, අලෙවි හා පුහුණු පහසුකම් සපුරාලීම.

(උ) කර්මාන්ත පර්යේෂණ හා සංවර්ධන කටයුතු.

(ඌ) අධිකාරියේ කටයුතුවලට අවශ්‍ය නිලධාරීන් හා සේවකයන් පත් කිරීම හා ඔවුනට බලය පැවරීම.

(එ) අධිකාරියේ කටයුතු පරිපාලනය සඳහා නීති සම්පාදනය.

(ඒ) අධිකාරියේ සේවා සහ පහසුකම් සඳහා ගාස්තු අය කිරීම.

(ඔ) එහි බලතල සේවා හා කාර්ය ක්‍රියාත්මක කිරීමේදී අදාළ වන්නා වූ හෝ ආනුෂාංගික වූ සියලු ක්‍රියා හා දේවල්

(ඕ) කර්මාන්තකරුවන්ට මූලධනය හා ණය සැපයීමේහි උදව් වීම.

15. (i) අධිකාරියට අධිකාරියේම අරමුදලක් තිබිය යුතුයි. පහත සඳහන් මුදල් අධිකාරයේ අරමුදලට බැර කළ යුතුයි. අධිකාරියේ අරමුදල

(අ) අධිකාරියේ ප්‍රයෝජන සඳහා සබරගමුව පළාත් සභාව විසින් කලින් කළ වෙන් කරනු ලබන මුදල්

(ආ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත හෝ ප්‍රභවයන්ගෙන් හෝ ප්‍රදාන වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් ආධාර හා ත්‍යාග

(ඇ) යම් ප්‍රඥප්තියක් මඟින් අධිකාරියට මාරු කරනු ලබන මුදල්

(ඈ) අධිකාරිය විසින් පුද්ගලයන්, සමිති, කණ්ඩායම් සහ පුද්ගලික හෝ පොදු අංශ වලට අයත් සංවිධාන සඳහා සේවාවන් සැපයීම වෙනුවෙන් ලබාගන්නා ලද ගාස්තු සහ අධිකාරිය විසින් සපයන ලද මූල ධනය සහ ණයවලින් උපයන පොලී

16. අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය අධිකාරිය වෙතම පැවරෙන්නේය. අරමුදල් පාලනය

17. (i) අධිකාරයේ මුදල් කටයුතු සඳහා මුදල් වර්ෂය ලිත් වර්ෂය වන්නේය. අධිකාරියේ මුදල් වර්ෂය හා ගිණුම් පරීක්ෂණ කටයුතු

(ii) අධිකාරිය විසින් සියලු ආදායම් සහ වියදම්,වත්කම් සහ බැරකම් සහ අධිකාරයේ අනෙකුත් සියලු ගණුදෙනු පිළිබඳ නියමිත ගිණුම් පොත් පත් පවත්වාගෙන යා යුතුවේ.

(iii) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි අධිකාරියේ සඳහන් පොදු ව්‍යවස්ථාවල ගිණුම් පරීක්ෂණ සඳහා අදළ වන්නාවූ විධිවිධාන, අධිකාරියේ ගිණුම් පරික්ෂණ සඳහාද අදළ වන්නේය.

(iv) අධිකාරියේ ගිණුම් පරීක්ෂණ පිළිබඳ වාර්තාව අධිකාරිය විසින් ඇමතිවරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම ගිණුම් වාර්තාව සෑම මුදල් වර්ෂයක් අවසානයට ප්‍රථම පළාත් සභාව ඉදිරියේ තැබිය යුතුවේ.

18. අධිකාරියේ සියලුම නිලධාරීන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතුයි. අධිකාරියේ නිලධාරීන් හා සේවකයන් රාජ්‍ය නිලධරයන් වේ

අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබේ.

19. අධිකාරියේ අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගත යුතුය

අධිකාරියේ මූල්‍ය පාලනය

20. (i) අධිකාරිය සබරගමුව පළාතේ මූල්‍ය රීති හා රාජ්‍ය මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ.

(ii) අධිකාරිය සතු යම් ආයතනයක් හෝ සේවාවක යම් හේතුවක් නිසා වැසී යාමක් හා නීත්‍යානුකූලව වසා දැමීමක් කල විට ඊට අදාල චංචල හා නිශ්චල දේපල අධිකාරිය වෙත පැවරෙන්නේය. එසේම එකී ආයතනය හෝ සේවාව සතු බැරකම් අධිකාරිය වෙත පැවරෙන අතර අධිකාරිය නිසි පරිදි එම කටයුතු කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය අවස්ථාවල එම පැවරුණු නිශ්චල හා චංචල වත්කම් නිසි පරිදි විකුණා වගකීම් ඉටුකළ යුතුය.

(iii) අධිකාරියට අයත් සෑම ආයතනයක් හා සේවාවක් සඳහාම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්විය යුතු අතර එකී බලතල අමාත්‍යාංශය ලේකම්ට හිමි වේ. අමාත්‍යාංශ ලේකම් විසින් අධිකාරියේ සභාපතිවරයා වෙත යොමු කරන වාර්තාවේ පිටපතක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(iv) අභ්‍යන්තර විගණන අංශය හා විගණකාධිපතිවරයා විසින් එවනු ලබන විගණන වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාකච්ඡාවට භාජනය විය යුතුය. එහි පෙන්වා දෙන අඩුපාඩුකම් සකස් කර ගැනීම හා විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වන්නේය.

සභාපතිවරයා විසින් සේවකයන් වෙත බලය පැවරීම

21. සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ලිඛිත අනුමැතිය ඇතිව, අධිකාරියේ ඕනෑම සේවකයකු වෙත ලිඛිත බලතල සේවා හා කාර්යය පැවරිය හැකි වීම.

අධිකාරිය වෙත ලැබෙන්නා වූ වාර්ෂික දීමනාව

22. සේවක වැටුප් දීමනා හා වෙනත් ගෙවීම් සඳහා වන වියදම් දැරීමට ද අධිකාරිය භාරයේ තිබෙන්නා වූ නිශ්චල සහ චංචල දේපල නඩත්තු කිරීම පිණිස ද මේ ප්‍රඥප්තිය යටතේ වන්නා වූ සේවා කාර්ය හා බැඳීම් සඳහා ද සබරගමුව පළාත් සභාව විසින් වාර්ෂික දීමනාවක් අධිකාරිය වෙත නිදහස් කළ හැකිය.

ණයට ගැනීම පිළිබඳ බලතල

23. මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරියේ බැඳීම සඳහා හෝ අධිකාරියේ සේවා කාර්යයන් ඉටු කිරීම සඳහා අධිකාරියට අවශ්‍ය වන මුදල් අයිරාවක මාර්ගයෙන් හෝ අන්‍යාකාරයකින් අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් දෙන ලද යම් පොදු අනුමැතියක නියමයන්ට අනුකූලව ණයට ගනු ලැබිය හැකිය.

අමාත්‍යවරයාගේ විධාන

24. (i) අධිකාරියේ කටයුතු පිළිබඳව අමාත්‍යවරයා විසින් අධිකාරිය වෙත විධාන කරනු ලැබිය හැකි අතර අධිකාරිය විසින් එම විධාන ඉටු කළ යුතුය.

(ii) අධිකාරියේ වාර්තා හා තොරතුරු තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් අධිකාරියට විධාන කළ හැකි අතර අධිකාරිය විසින් එකී වාර්තා සහ තොරතුරු හැකි ඉක්මණින් සැපයිය යුතුයි.

නියෝග

25. (i) අධිකාරියේ අදාළ කරුණු පිළිබඳව අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

(ii) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ඇමති මණ්ඩලයේ අනුමැතිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු වේ.

(iii) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු සබරගමුව පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාවේ අනුමැතිය ලැබීමෙන් පසු ගැසට් පත්‍රයේ පළකළ යුතුය.

26. මෙම ප්‍රඥප්තිය ක්‍රියාක්මක වීමත් සමඟ 1990 අංක 04 දරණ සබරගමුව පළාත් සභාවේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය මෙම පළාත තුළ බල නොපැවැත්වෙන්නේය. ඒ වෙනුවට 2017 අංක 14 දරන මෙම ප්‍රඥප්තිය සඳහා සබරගමුව පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලද දින සිට පළාත තුල මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වේ.

27. (i) මෙම ප්‍රඥප්තිය සහ වෙනත් පවත්නා නීතියක් අතර ප්‍රතිවිරුද්ධතාවයක් හෝ නොගැලපීමක් ඇති වූ අවස්ථාවකදී මෙම ප්‍රඥප්තියේ විධිවිධාන පවත්නා නීතිය යටපත් කරන්නේය.

(ii) මෙම ප්‍රඥප්තියේ දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පවත්වන්නේය.

28. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියෙහි '' අමාත්‍යවරයා '' යනුවෙන් හඳුන්වනුයේ සබරගමුව පළාත් සභාවේ කර්මාන්ත, විෂය භාර අමාත්‍යවරයාය. අර්ථ නිරූපනය

'' පළාත් සභාව '' යනුවෙන් හඳුන්වනුයේ සබරගමුව පළාත් සභාව ය.

'' ඇමති මණ්ඩලය '' යනුවෙන් හඳුන්වනුයේ සබරගමුව පළාත් සභාවේ ඇමති මණ්ඩලයයි.

'' ලේකම් '' යනුවෙන් හඳුන්වනුයේ සබරගමුව පළාත් සභාවේ කර්මාන්ත අමාත්‍යංශයේ ලේකම් යන්න අදහස් වේ.

12 - 321

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.